මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/76** **2024.09.12**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### ඡන්ද පෙට්ටි මාරු කිරීම සම්බන්ධයෙන් වූ මිත්‍යා මතය දුරු කිරීම

ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසුව ඡන්ද පොළෙන් රැගෙන එන ඡන්ද පත්‍රිකා බහාලූ ඡන්ද පෙට්ටියම කිසිඳු වෙනසක් නොමැතිව නියමිත ගණන් කිරීමේ ශාලාව වෙත ගෙනවිත් භාරදෙන්නේ ද යන්න පිළිබඳව සමහර දේශපාලඥයන්/ අපේක්ෂකයන් තුළ සැක ඇති බව ප්‍රකාශ කර තිබේ. එවැනි කිසිඳු අක්‍රමිකතාවක් සිදුවිය නොහැකි නමුත් එකී සැකය දුරු කිරීමේ පියවරක් වශයෙන් පසුගිය ඡන්ද විමසීම්වල දී ඡන්ද පෙට්ටිය විනිවිද පෙනෙන  බෑගයක දමා අගුලු දමා රැගෙන ඒමට උපදෙස් දෙන ලදී. මෙම ඡන්ද විමසීමේදී ද එම ක්‍රියා පිළිවෙල ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනු ලැබේ. එයට අමතරව ඡන්ද විමසීමෙන් පසු ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීමේ දී අහඹු ලෙස තෝරා ගත් ඡන්ද පොළ කාර්ය මණ්ඩල සාමාජිකයන් / ඡන්ද පොළ නියෝජිතයන් විසින් පිටපත් 6 කින් යුතුව අත්සන් කළ ආකෘතියක මුල් පිටපත ද එහි අලවා එක් පිටපතක් සුරක්ෂිතව ගණන් කිරීමේ ශාලාව වෙත යැවෙන අතර අනෙකුත් පිටපත් එම අවස්ථාවේදී ම ඡන්ද පොළ නියෝජිතයන්ට නිකුත් කිරීමටද ක්‍රියා කරනු ලැබේ.

එයට අමතරව ඡන්ද පොළේ සිට ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය ආසන්නයේ වූ අවසන් පොලිස් මුරපොළ දක්වා ඡන්ද පෙට්ටිය රැගෙන එන වාහනය පසුපසින් අපේක්ෂකයන්ගේ නියෝජිතයන් වාහනයකින් පැමිණීමට අවශ්‍ය යැයි කරනු ලබන ඉල්ලීමකට ඉඩ දීමට තීරණය කර ඇත. යම් අපේක්ෂකයෙකුට අවශ්‍ය නම් අවසන් මුරපොළේ සිට ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය දක්වා මග දෙපස, අවසර ලබා දී ඇති ස්වකීය ගණන් කිරීමේ නියෝජිතයන් රඳවා තැබිය හැකි අතර ඒ පිළිබඳව පොලිස් නිලධාරීන් ද දැනුවත් කර ඇත.

තරග කරන අපේක්ෂකයන් සියල්ල වෙනුවෙන් වාහනයක් බැගින් ඡන්ද පෙට්ටි සහිත සෑම වාහනයක් පිටු පසින්ම යාම ප්‍රායෝගික නොවන බව අවධාරණය කරනු කැමැත්තෙමි. එසේ යාමට අවශ්‍යවන මධ්‍යස්ථානයේ නම, රැගෙන එන වාහනයේ අංකය වාහනයේ ගමන් කරන නියෝජිතගේ නම ඇතුළත් විස්තර වාර්තාවක් ඡන්ද විමසීම් දිනට දින තුනකට (03) පෙරාතුව සෑම බලයලත් නියෝජිතයකු විසින්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලබාදිය යුතු අතර, ඒ සඳහා නිකුත් කරනු ලබන වාහන බලපත්‍රය අදාළ ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිගෙන් ලබා ගත හැකි ය.

ඡන්ද ගණන් කිරීමේ ශාලාවට පස්වරු 3.00 සිට එක් ගණන් කිරීමේ නියෝජිතයකුට පැමිණ සිටීමට අවසර ඇති අතර, සෙසු නියෝජිතයන්ට වුවද ගණන් කිරීමේ පරිශ්‍රයට පස්වරු 3.00 සිට පැමිණ සිටීමට බාධාවක් නොමැති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl